11 ශ්‍රේණිය

ඉතිහාසය

1.3 ඒකකය

කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

# කියවීම් පත්‍රිකාව





## කාර්මික විප්ලවය

# කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

- දේශපාලන

1. ධනපති හා නිර්ධන වශයෙන් පන්ති දෙකක් බිහිවීම

කාර්මික විප්ලවය නිසා උපරිම ලාභ ලැබීම අරමුණු කොට ගෙන මුදල් ආයෝජනය කළ ධනපති පන්තියක් හා ශ්‍රමය විකුණා ජීවත් වන නිර්ධන පන්තියක් බිහි විය. ධන හිමියන් නිර්ධන පන්තියේ ශ්‍රමය අඩු මිලට ලබාගෙන සිය ව්‍යාපාරික කටයුතුවල යොදවා එමගින් විශාල ලාභ ලැබූහ. එහෙත් කර්මාන්තශාලාවල සේවයකල කම්කරුවන්ගේ ජීවන තත්ත්වය ඉතා පහළ මට්ටමක පැවතුණි.

2. විවිධ දේශපාලන දර්ශන බිහිවීම

ධනපති පන්තියේ පීඩාකාරී ක්‍රියාවන් හේතුවෙන් නිර්ධන පන්තිය වෘත්තීය සංගම් බිහි කර ගැනීම, සේවක වැඩ වර්ජන වලට පෙළඹීම, අයිතිවාසිකම් සඳහා සටන් ආදිය ආරම්භ විය. මෙම තත්ත්වය ලිබරල් වාදී , සමාජවාදී විවිධ දේශපාලන දර්ශන වල ව්‍යාප්තියට හේතු විය.

3. යටත්විජිත අල්ලා ගැනීමේ තරගය

කාර්මීකරණය යුරෝපය පුරා පැතිර යාමත් සමඟ අමුද්‍රව්‍ය අඩු මිලට ලබා ලබා ගැනීමෙන් නිෂ්පාදිත භාණ්ඩ වැඩි මිලට විකුණා ගැනීමෙන් අවශ්‍යතාව ප්‍රබල ලෙස මතු විය . මේ හේතුව නිසා යුරෝපා රටවලට තම යටත් විජිත පූර්ණ වශයෙන් දේශපාලනික ආධිපත්‍යයට නතු කර ගැනීමේ තරගයක නිරත වීමට සිදුවිය . මේ අනුව 1850 වර්ෂයට පසුව ඇතිවූ මෙම අධිරාජ්‍යවාදය නව අධිරාජ්‍යවාදය ලෙස හැඳින්වේ . යටත්විජිත පුළුල් කර ගැනීමට යුරෝපා රටවල් තරගයක නිරත වීම නිසා එය පළමු ලෝක මහා සංග්‍රාමය ඇතිවීමට පවා මුල් වූ හේතු සාධකයක් විය .

- ආර්ථික ක්ෂේත්‍රයේ ඇති කළ බලපෑම

1. බද්ධ ව්‍යාපාර බිහිවීම

පුළුල් වූ වෙළෙඳ කටයුතු සඳහා මුදල් ආයෝජනය කිරීමට පෞද්ගලික ව්‍යවසායකයන්ට තනි තනිව කළ නොහැකි විය. එනිසා ව්‍යවසායකයන් කිහිප දෙනෙක් එකතු වී බද්ධ ව්‍යාපාර සංවිධාන බිහි කර ගැනීම. මේ අනුව යුරෝපා රටවල් වෙළඳ සමාගම් පිහිටුවා ගන්නා ලදී.

උදා : පෙරදිග ඉන්දීය ඉංග්‍රීසි වෙළඳ සමාගම

පෙරදිග ඕලන්ද වෙලඳ සමාගම

පෙරදිග ප්‍රංශ වෙළෙඳ සමාගම

මෙම සමාගම් විසින් අරමුණු ඉටුකර ගැනීම සඳහා එම රටවල රාජ්‍ය අනුග්‍රහය ඇති ආසියා , අප්‍රිකා, ලතින් ඇමරිකා ප්‍රදේශවල තම වාණිජ කටයුතු ව්‍යාප්ත කිරීම සිදුවිය.

2. ආනයන අපනයන වෙළදාම

කාර්මික නිෂ්පාදන පුළුල් වීම සහ වෙළෙඳ හා වාණිජ කටයුතු ආර්ථික ක්ෂේත්‍රයේ පෙරමුණ ගැනීම නිසා ධනපති පන්තියක් හා වෙළඳ පන්තියක් ක්‍රමයෙන් වර්ධනය විය. සුළු ඉඩම් වල ගොවීන්ට තම කටයුතු කර ගත නොහැකිව කම්හල්වල ශ්‍රමිකයන් සේ නගරයට ඒමට සිදුවිය.

- සමාජීය ප්‍රතිඵල

1. පන්ති සහිත සමාජයක් බිහිවීම

20 වන සියවස වන විට යුරෝපයේ සෑම රටකම පාහේ ආර්ථික කටයුතු මෙහෙයවනු ලැබුවේ කර්මාන්ත හිමි ධනපති පන්තියක් විසිනි. මෙම ධනපති පන්තිය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත විය . එනම් ,

- ඉඩම් හිමි ධනවතුන් හා
- මධ්‍යම පාන්තික ව්‍යාපාර හිමියන් , කර්මාන්ත හිමියන්, බැංකුකරුවන් , කොන්ත්‍රාත්කරුවන් , ඉංජිනේරුවන් , නීතිඥයන් ආදියෙන් සැදුම් ලත් පිරිස ය.

කර්මාන්ත හිමියන් අඩු වැටුප් ගෙවා කම්කරුවන් සේවයේ යෙද වූ අතර එමඟින් අධික ලාභ උපයා ගත් අතර වඩාත් සැපවත් ජීවිත ගත කරන ලදී . සේවක පිරිස් අඩු වැටුප් ලබමින් දුක්ඛිත ජීවිත ගත කිරීම නිසා පන්ති සහිත සමාජයක් බිහිවිය.

2. අඩු පහසුකම් සහිත වාසස්ථාන හා විවිධ සමාජ ගැටලු ඇතිවීම

කම්කරුවන් කාර්මික නගර වල කර්මාන්ත ශාලාව අවට අනිවාර්යෙන්ම පදිංචි විය යුතුය . මුඩුක්කු පේළි නිවාස ඔවුන්ගේ වාසස්ථාන වූ අතර අවම මට්ටමේ සනීපාරක්ෂක පහසුකම්වත් ඒවායේ නොතිබිණ. එම නිවාස වල එක් කාමරයක් තුළට කොටු වී පවුලේ සාමාජිකයන් සියලු දෙනාම ජීවත් වූහ . මෙම පීඩාකාරී තත්ත්වයන් හේතුවෙන් බීමත්කම හා විවිධ සමාජ අපචාර ක්‍රියාවන් ද සිදු වීම දැකිය හැක .